පාතහේවාහැට ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------- | -------------- | ----------------------------- |
| (අ) | වර්ෂය තුළ මිල දී ගෙන තිබූ රු.958,970 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 06 ක් හා රු.177,131 ක් වටිනා කාර්යාල හා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 අවසන් ගිණුම තුළින් නිවැරදි කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ මිල දී ගත් කථන පද්ධතියේ වටිනාකම රු.1,331,685 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 අවසන් ගිණුම තුළින් නිවැරදි කරමි. |
| (ඇ) | පරිත්‍යාග ලෙස ලැබී තිබූ සහ මිල දී ගත් රු.1,200,000 ක ඉඩම් කොටස් 02 ක්, පරිත්‍යාග ලෙස ලද ඔප්පු අංක 234 ඉඩමේ වටිනාකම, ලූල්කඳුර සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ රු.5,957,538 ක ඉදිකිරීම් වටිනාකම සහ දෙල්තොට ප්‍රාදේශීය උප කාර්යාලය අලුත්වැඩියා කිරීම සඳහා දැරූ රු.902,439 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 අවසන් ගිණුම තුළින් නිවැරදි කරමි. |
| (ඈ) | ආර්පිකෝ බට (02") 985 ක වටිනාකම වූ රු.1,689,275 ක් මූල්‍ය ප්‍රකාශන තුළ ජල ගබඩා තොග ලෙස හඳුනා ගෙන නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 අවසන් ගිණුම තුළින් නිවැරදි කරමි. |

1.3.2 <u>නොසැසඳුණු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 02 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.90,603 ක නොසැසඳීමක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීම කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ රු.10,516,240 ක් හා අවුරුදු 01 ත් අවුරුදු 05 ත් අතර වූ රු.48,129,236 ක් ලැබිය යුතුව තිබුණි. | ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟය අය කර ගැනීමට කටයුතු කරමි. |

1.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඔප්පු, පැවරුම් නියෝග, තක්සේරු වාර්තා ආදී තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.17,614,207 ක් වූ ගනුදෙනු විගණනයේ දී, සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ස්ථාවර වත්කම් තක්සේරු කිරීමට සමීක්ෂණ මණ්ඩලයක් පත් කර, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර, අත්තිකාරම් මුදල ගිණුමෙන් ඉවත් කිරීමට අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |

1.4 <u>අනුකූල නොවීම</u>

<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24 වගන්තිය | සභාව නඩත්තු කරනු පාරවල් සහ පටු මාවත් සම්බන්ධයෙන් නාම ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | පනත ප්‍රකාරව, නාම ලේඛනයක් පවත්වා ගත යුතු වේ. | මාර්ග ලේඛනය සකස් කළ පසු ලේඛන පවත්වා ගනිමි. |
| (ii) | 126(xxx) වගන්තිය | විධිමත් අවසරයකින් තොරව ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 51 කින් ගාස්තු අය කර | පනත ප්‍රකාරව, දැන්වීම් පුවරු හඳුනා ගෙන ගාස්තු අය කිරීමට | ගාස්තු අය කිරීමට කටයුතු සිදු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගැනීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු කළ යුතු වේ. | |
| (iii) | 154(1) වගන්තිය | ඉඩම් විකුණුම් මුදලින් අය විය යුතු බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව, ඉඩම් විකුණුම් මත අය කරන සියයට 01 ගාස්තුව අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී, පිළිතුර ලබා දීමට කටයුතු කරමි. |
| (iv) | 158 වගන්තිය | හිඟ අක්කර බදු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ආදායම් දීර්ඝ කාලීනව හිඟ හිටීමට නොදී කාලීනව අය කර ගත යුතු වේ. | සමීක්ෂණයක් සිදු කර දේපල හඳුනා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ, 218 රීතිය | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර හඳුනා ගත යුතු වේ. | මූලික කටයුතු සිදු කරමින් පවතී. |
| (ඇ) | 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 434 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වසර 05 කට වරක් වරිපනම් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් අය කරන දේපළ වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වේ. | නව තක්සේරුවක් කිරීමට කටයුතු කරමින් පවතී. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,598,203 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,037,388 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,457,319 | 2,257,124 | 2,248,475 | 6,484,677 | 11,354,482 | 10,061,875 | 8,466,490 | 22,728,124 |
| (ii) | කුලී | 4,102,089 | 3,441,900 | 3,733,878 | 702,776 | 3,729,356 | 3,921,109 | 4,315,015 | 886,610 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,131,325 | 2,907,999 | 2,577,599 | 2,369,700 | 5,333,250 | 2,404,587 | 2,404,587 | -- |
| (iv) | වෙනත් ආදායම් | 36,927,188 | 41,463,018 | 13,904,751 | 84,234,185 | 29,099,540 | 28,007,204 | 13,758,995 | 50,296,617 |
| | එකතුව | 47,617,921 | 50,070,041 | 22,464,703 | 93,791,338 | 49,516,628 | 44,394,775 | 28,945,087 | 73,911,351 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| (i) | දීර්ඝ කාලයක සිට රජයේ ආයතනවලින් අය විය යුතු රු.1,533,458 ක හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු ශේෂ අය කර ගත යුතු වේ. | ලිපි මඟින් දන්වා යවා ඇති අතර, මුදල හිඟයකින් තොරව අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | සභාවේ දියුණු ප්‍රදේශවල අලුතින් ඉදිකළ නිවාස/ ගොඩනැගිලි හඳුනා ගෙන වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ හඳුනා ගෙන වරිපනම් බදු අය කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නැත |
| (ආ) | ජල ගාස්තු | | |
| (i) | පස්ගම ජල ව්‍යාපෘතියේ ඒකක 09 කින් අය විය යුතු රු.54,570 ක ජල ගාස්තු මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අය කර ගත යුතු වේ. | ජංගම සේවා මඟින් හිඟ ගාස්තු අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | මුදුනකඩේ ජල යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලද පාරිභෝගිකයින්ගෙන් අය විය යුතු රු.1,409,142 ක ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජල ගාස්තු කපා හැරීම සඳහා විෂයය භාර ඇමති වෙත ඉදිරිපත් කර ඇත. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තලාතුඔය අංක 03 කඩ කාමරය බදුගත් බදුකරුගෙන් 2014 මැයි 05 දිනට අය විය යුතු රු.231,410 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩ කුලී දීර්ඝකාලීනව හිඟ වීමට නොදී, අය කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. | මෙම කඩ කාමරය සඳහා නීතිමය කටයුත්තක් පවතී. |

2.2.4 <u>බලපත්‍ර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාරස්සන නගරයේ වෙළඳ ව්‍යාපාර 10 ක් වෙළඳ බලපත්‍ර ලබා ගැනීමට ගාස්තු ගෙවා ඇතත්, බලපත්‍ර නිකුත් කර නොමැත. | අදාළ බලපත්‍රය ලබා දීමට කටයුතු කළ යුතු වේ. | වෙළඳ බලපත්‍රය ලබා ගන්නා ලෙස දැනුවත් කර ඇත. |

2.2.5 <u>වෙනත් ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ත්‍රීරෝද රථ ගාස්තු<br>2018 දෙසැම්බර් 31 දිනට ත්‍රීරෝද රථ 446 කින් අය විය යුතු රු.1,671,550 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ත්‍රීරෝද රථ සඳහා ගාස්තු අය කිරීමේ කාර්යසාධනය වැඩි කළ යුතු වේ. | නිත්‍යානුකූලව පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) දැන්වීම් පුවරු ආදායම<br>තලාතුඔය කලාපයට අදාළ දැන්වීම් පුවරු 15 කින් අය විය යුතු රු.76,821 ක ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැන්වීම් පුවරු මඟින් ගාස්තු අය කළ යුතු වේ. | දැන්වීම් පුවරු ගාස්තු අයකිරීමට දැන්වීම් පුවරු ආයතනවලට ලිඛිතව දැන්වීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු<br>සම්ප්‍රේෂණ කුළුණු පිළිබඳව සමීක්ෂණයක් සිදු කර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදු කර, අය විය යුතු ගාස්තු අය කර ගත යුතු වේ. | ඉදිරියේ දී සමීක්ෂණය සිදු කර, ගාස්තු අය කිරීමට කටයුතු කරමි. |

2.2.6 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,328,450 ක් හා රු.64,018,942 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගත යුතු වේ. | 2019.03.15 දිනට ලැබූ උසාවි දඩ මුදල් රු.3,191,170 ක් සහ 2019.04.23 දිනට ලැබූ උසාවි දඩ මුදල් රු.350,500 කි. මුද්දර ගාස්තු සඳහා 2019 මාර්තු මස යම් මුදල් ප්‍රමාණයක් ලැබී ඇත. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්යසාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>කර්තව්‍යයන් ඉටු නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ වෙන් කළ රු.2,877,000 කින් රු.2,489,075 ක් හෙවත්, සියයට 87 ක් අදාළ කාර්යයන් වෙනුවෙන් වැය කර නොතිබුණි. | මහජන සුභ සිද්ධිය උදෙසා ප්‍රතිපාදන වන අරමුදල් උපරිම පරිදි උපයෝජනය කළ යුතු වේ. | ඉදිරියේ දී, මෙවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරමි. |

(ආ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා රු.200,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත්, ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි. | පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ. | ඉදිරියේ දී, මෙවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරමි. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම පිළිබඳව සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම පිළිබඳව සැලසුම් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී, සකස් කිරීමට කටයුතු කරමි. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව ක්‍රියාත්මක කරනු ලබන උඩුවෙල, මුරපොල හා කොළඹිස්ස ජල ව්‍යාපෘතිවල ජල මනු 280 ක් අක්‍රීය වී තිබූ නිසා, නිවැරදි ජල ගාස්තු අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | අක්‍රීය වී පවතින ජල ව්‍යාපෘති සඳහා නව ජල මනු සවි කර, නිවැරදි ජල ගාස්තුව අය කළ යුතු වේ. | ජල මනු ඇණවුම් කිරීමට කටයුතු කර ඇති අතර, ලද විගසම සවි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ජල ව්‍යාපෘති 08 කින් අය විය යුතු රු.16,372,260 ක මුදලක් අය කර නොතිබුණි. | අය විය යුතු හිඟ ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජංගම සේවා පවත්වා අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත සේවක සංඛ්‍යාව තුළ තනතුරු 15 ක පුරප්පාඩු 56 ක් සහ තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුරෙහි අතිරික්තයක් තිබුණි. | සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට යටත්ව කටයුතු කළ යුතු වේ. | ප්‍රාථමික ගණයේ තනතුරු 29 ක් බඳවා ගෙන ඇති අතර, තනතුරු 07ක් බඳවා ගැනීම සඳහා ගැසට් පත්‍ර සකස් කර, අනුමැතියට යොමු කර ඇත. |
| (ආ) | මහනුවර මහා නගර සභාවට ස්ථාන මාරු වී ගිය නිලධාරිනියකගේ අය විය යුතු රු.160,854 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර නොතිබුණි. | ස්ථාන මාරු වී ගිය විගසම ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ණය ශේෂ අය කර ගැනීමට මේ වන විටත් කටයුතු කරමින් පවතී. |

3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු සුසාන භූමි, පොදු ළිං, සායන මධ්‍යස්ථාන, ඉඩම් හා ඒවායේ අයිතිය නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතුව පවතින දේපළවල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම්, ගොඩනැගිලි සමීක්ෂණය තුළින් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ඉඩම් කට්ටි කිරීමෙන් සභාවට ලැබී තිබූ ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | සභාවට ලද ඉඩම් කොටස් නිවැරදිව හඳුනා ගෙන ලේඛනයක් පවත්වා ගැනීම කළ යුතු වේ. | විෂය භාර නිලධාරී විසින් සකස් කරමින් පවතී. |
| (ඇ) | කඳුරට සඳැල්ල අනු බෙදුම ඉඩමේ ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් කොටස් අංක 13 සහ 40 කඳු හා බෑවුම් සහිත වූ ප්‍රදේශයක කෙළවරින් ලබා ගෙන තිබීම නිසා, පොදු පහසුකම් සඳහා භාවිතා කිරීමට නොහැකි වී තිබුණි. | පොදු පහසුකම් සඳහා භාවිතා කළ හැකි ඉඩම් කොටසක් සභාව විසින් ලබා ගෙන එහි පොදු පහසුකම් සැලසිය යුතු වේ. | ඉඩම් සමීක්ෂණය තුලින් හඳුනාගත් පසු වැට මායිම් නිරවුල් කරන බව දන්වා ඇත. |
| (ඈ) | 1994 – 2012 කාල පරිච්ඡේදය තුළ බදු දුන් කඩ කාමර 64 ක බදු ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | බදු ගිවිසුම් අලුත් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නැත |

3.5 <u>වත්කම් කළමනාකරණය</u>

3.5.1 <u>වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගලහා විවෘත වෙළඳ පොලේ විවෘත කඩ කාමර 03 ක් ගිවිසුම්ගත වීමකින් තොරව වර්ෂ 10 කට වැඩි කාලයක සිට බාහිර පාර්ශවයකට බදු දී තිබුණි. | බදු දීමට පෙර ගිවිසුම්ගත විය යුතු වේ. | නව තක්සේරුවක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. එය ලැබුණු පසු ඉදිරි කටයුතු කරමි. |

3.5.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | --------------------------------- |
| (අ) | සභාව සතු ජල යෝජනා ක්‍රම 08 ක පාරිභෝගික ඒකක 2547 කින් මනු රහිතව ස්ථාවර ජල ගාස්තුවක් පමණක් අය කර තිබුණි. | මනු සවි කර නිවැරදි ජල ගාස්තුව අය කිරීමට කටයුතු කළ යුතු වේ. | ජල මනු ඇණවුම් කිරීමට කටයුතු කර ඇති අතර, එය ලද විගස සවි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | කඳුරට සැඳැල්ල අනු බෙදුම යටතේ සභාවට හිමි වූ ඉඩම් කොටස් 02 තුළ ඉතා හොඳින් වැඩුණු ඵල දරන පොල් ගස් 50 කට අධික ප්‍රමාණයක් පැවතියත්, ඉන් සභාවට ආදායමක් ලබා ගැනීමට කටයුතු නොකර, ඉඩම් වල් බිහි වීමට ඉඩ හැර තිබුණි. | ආදායම් උත්පාදනය කර ගැනීමට පියවර ගත යුතු වේ. | ස්ථාවර වත්කම් සමීක්ෂණය මඟින් හඳුනා ගත් පසු ඉදිරි කටයුතු කරමි. |

3.5.3 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | -------------- | --------------------------------- |
| සභාව විසින් කට්ටි කරන ලද ඉඩම් 06 කින් ලබා ගත් ඉඩම් කොටස් සඳහා අදාළ ඔප්පු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිත්‍යාග ලෙස ලැබූ ඉඩම් කොටස් විධිමත් ඔප්පුවක් මඟින් පවරා ගත යුතු වේ. | ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණය තුළින් නිවැරදිව හඳුනා ගෙන ඉදිරි කටයුතු කරමි. |

3.5.4 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | --------------------------------- |
| (අ) | 2015 පෙබරවාරි 06 දින සභාවට ලබා දී තිබුණු රු.17,649,179 ක වටිනාකමින් යුත් බැකෝ ලෝඩරය සමාලෝචිත වර්ෂය තුළ දින 11 කදී යන්ත්‍ර පැය 49.4 ක් පමණක් ධාවනය කර තිබූ අතර, අලුත්වැඩියා හා අනෙකුත් වියදම් සඳහා රු.577,181 ක් දරා තිබුණි. | වාහන උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව භාවිතා කළ යුතු වේ. | බැකෝ ලෝඩර් යන්ත්‍රය සඳහා ස්ථිර රියදුරෙකු බඳවා ගත් පසු උපරිම කාර්යක්ෂමතාවයකින් යොදවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව සතු රු.703,000 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 03 ක් නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි. | වත්කම් නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වීමට කටයුතු නොකළ යුතු වේ. | 2018 භාණ්ඩ සමීක්ෂණය තුළින් ට්‍රැක්ටර් ටේලර් 03ක් විකිණීම සඳහා නිර්දේශ කර ඇත. |
| (ඇ) | සභාවේ තොග ලේඛන නියැදියක් පරීක්ෂා කිරීමේ දී, වසර 03 ත් 05 ත් අතර කාලයක් තුළ නිකුත් කර නොතිබූ, රු.200,029 ක් වටිනා ජලනළ උපාංග ඒකක 336 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | ගබඩා තොග නිෂ්ක්‍රීය නොවීමට වග බලා ගත යුතු වේ. | ඉදිරියේ දී, පිළිතුරු ලබා දෙමි. |

3.6 <u>ප්‍රසම්පාදනය</u>

3.6.1 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.38,012,125 ක් දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ දී, පිළිතුරු ලබා දීමට කටයුතු කරමි. |

3.6.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහ/උඩපිටිය අල්හුස්නා මහා විද්‍යාලය ඉදිරිපිට කොටස බිම් ඇතුරුම් ගල් අතුරා සංවර්ධනය කිරීම් කර්මාන්තය | | |
| කර්මාන්තයට අදාළ මූලික ඇස්තමේන්තුව ප්‍රකාරව, වර්ග මීටර් 109.8 ක් ආවරණය වන පරිදි 25 $N/mm^2$ ශක්තියෙන් යුතු බිම් ගල් ඇතිරීම සිදු කළ යුතු වුවත්, භාවිතා කළ ගල්වල ශක්තිය 19.08 – 20.09 ක අතර පරාසයක් වූ බැවින්, ප්‍රමිතියකින් තොර ද්‍රව්‍ය භාවිතය සඳහා රු.251,479 ක් ගෙවා තිබුණි. | පිරිවිතරයේ සඳහන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලක්ෂණ සනාථ වූ පසු ගෙවීම් සිදු කළ යුතු වේ. | 80mm උස $25n/mm^2$ සඳහා ඇස්තමේන්තු සකස් කලද අතුරා ඇති ගල් 70mm සහ දළ වශයෙන් 20 $n/mm^2$ වන බැවින්, වෙළඳපොල මිල සලකා සිදු වන අලාභය වළක්වා ගැනීම සඳහා බිල්පතෙන් යම් ප්‍රතිශතයක් අඩු කර ගෙවා ඇත. |